# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 50 දරන ඉදිරි ලෝකය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 සැප්තැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

## 2009 අංක 50 දරන ඉදිරි ලෝකය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 25 වන දින]

එල්.ඩී.—ඕ. 33/2007.

**ඉදිරි ලෝකය සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව.

"ඉදිරි ලෝකය සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි කටුබැද්ද, මොරටුව පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2009 අංක 50 දරන ඉදිරි ලෝකය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඉදිරි ලෝකය සංවිධානය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිරි ලෝකය සංවිධානයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ඉදිරි ලෝකය සංවිධානය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියළු අධිකරණවලදී නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

PL 004215 -2,650 (2009/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් අද පවතින ලෝකයට වඩා ශිෂ්ඨ වූත් බෙදීම්වලින් තොර වූත් මිනිසාගේ ජීවන තත්ත්වය වඩා ඉහළ තලයකට ගෙන එනු ලබන්නා වූත් අදට වඩා හොඳ හෙටක් ඇති අනාගත ලොවක් සඳහා කටයුතු කිරීම ;

(ආ) සමාජයේ අපේක්ෂිත මට්ටමෙන් පහලට ගොස් සිටින අයට සහන සේවා සහ ආධාර ලබාදීම ;

(ඇ) ව්‍යසනවලදී විපතට හා අසරණ බවට පත්වූවන්ට ආධාර ලබාදීම.

(2) සංස්ථාව විසින් සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී කවර තැනැත්තකුගේ වුව ද ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ දේශපාලන අදහස් ආදිය නොසලකා ක්‍රියා කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ විධිවිධාන හා 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව, සංස්ථාවේ රීතිවලට අනුව තෝරා පත් කර ගන්නා ලද සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරික සහ සැලසුම් හා මෙහෙයුම් අධ්‍යක්ෂවරයාගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ ද, තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, මේ පනතේ රීති අනුව නව කළමනාකරණ මණ්ඩලයක් පත් කරන තුරු ඔවුන් එම ධුරය දැරිය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

**5.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේම සහ ඉන්පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් පවත්වා ගෙන යාමට කළමනාකරණ මණ්ඩලය විසින් කටයුතු සම්පාදනය කළ යුතු ය.

**6.** මේ පනතේ විධිවිධානවලට යටත්ව—

සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හා අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා රජයේ හෝ අනුමත බැංකු හා ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට හෝ ආධාර හා පරිත්‍යාග (දේශීය හෝ විදේශීය) වශයෙන් ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළහැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදලක් කළමනාකරණ මණ්ඩලය සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාගයන් සහ සියලු වර්ගවල ත්‍යාග, ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට ;

(ඌ) සංස්ථාවේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කළ සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, නිලධරයන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්යය සහ චර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ, සංස්ථාවේ හෝ යම් සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම, වේලාවන්, ස්ථානයන්, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි අරමුදලේ භාරකාරත්වය දැරීම.

(2) එම රීති (1) වන උපවගන්තිය යටතේ රීතියක් සෑදූ ආකාරයෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ ආදායම සහ වියදම ද, වත්කම් සහ බැරකම් සහ අනෙක් සියලුම ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට සංස්ථාව කටයුතු කළ යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක සාමාජිකයන් වන එකී ආයතනයේ එක් එක් නේවාසික හවුල්කරුවන් සහිත ගණකාධිකාරී පාලක මණ්ඩලය විසින් ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තිය සඳහා නිකුත් කළ සහතිකයක් සන්තකයේ, ඇති ව්‍යාපාර ආයතනයක්,

අදහස් කෙරේ.

සංවිධානය විසින් ගෙවිය යුතු හා සංවිධානයට අය විය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පවත්නා සියලුම ණය සහ බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, සංගමයට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ දායක මුදල් හා ගාස්තු මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** යම් මිලට ගැනීමක්, දායක මුදලක්, තෑග්ගක්, ප්‍රදානයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, ඒ දේපළ උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සඳහා මේ පනතේ කාර්ය සඳහා සම්පූර්ණ බලය සහිතව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී සංගමයට අයත්ව තිබූ සියලු දේපළ සංස්ථාව වෙත සතු කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** තත්කාලයේ බලාත්මකව පවත්නා සංස්ථාවේ රීතිවල දැක්වෙන විධිවිධානවල නියම කර ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හරින ලද විටක, සංස්ථාවේ සියළු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වුව ද දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය ආදායම හෝ දේපළ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම එහි රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේ දැයි සංස්ථාවේ සාමාජිකයන් විසින් සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.